www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා සාම සාකච්ඡා හැලහැප්පීම් මධ්‍යයේ තවත් වටයකට ඇද්දී යයි

## Sri Lankan peace talks stagger on to another round

**විජේ ඩයස් විසිනි**
**2006 පෙබරවාරි 25**

ශ්‍රී ලංකා ආන්ඩුව සහ දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය අතර ජිනීවාහි පැවති දෙදින සාකච්ඡා -- තෙවසරකට ආසන්න කාල පරිච්ඡේදයක දී ප්‍රථම වරට පැවති සාකච්ඡා -- බ්‍රහස්පතින්දා කිසිදු සැලකිය යුතු මට්ටමේ එකඟතාවකින් තොරව බිඳ වැටුනි. කෙටි නිල නිවේදනයක් මගින් ප්‍රකාශ කෙරුනේ, 2002 දී අත්සන් කෙරුනු වත්මන් සටන් විරාම ගිවිසුම ආරක්ෂා කිරීමටත් අප්‍රේල් 19-21 දිනවල යලිත් රැස්වීමටත් දෙපාර්ශ්වය ම එකඟ වූ බව යි.

නෝර්වේජියානු පහසුකම් සැලැස්වීමේ කන්ඩායමේ ප්‍රධානී එරික් සොල්හෙයිම් මාධ්‍යවලට මෙසේ පැවසී යː "මෙය මා බලාපොරොත්තු වූ තත්වයට වඩා ඉහල දෙයකි. විශ්වාසය ගොඩනැගී තිබේ." එහෙත් සොල්හෙයිම් එවන් ප්‍රතිඵලයක් "බලාපොරොත්තු වූ තත්වයට වඩා ඉහල" දෙයක් ලෙස පිලිගැනීම ම දොරගුලු ලාගෙන පැවති සාකච්ඡා කෙතරම් නම් තියුනු මටටමක පැවතී ද යන වග පිලිබඳ ඇඟවුමකි. සටන් විරාමය ආරක්ෂා කිරීමටත් යලි හමු වීමට එකඟවීමටත් දෙපාර්ශ්වය අසමත් වී නම් විකල්පය වනවා ඇත්තේ ප්‍රචන්ඩ ක්‍රියා උත්සන්න වී පරිපූර්න යුද්ධයක් කරා යලි ඇද වැටීම යි.

නොවැම්බර් මැද මහින්ද රාජපක්ෂ ශ්‍රී ලංකාවේ ජනාධිපති ලෙස ජය ගැනීමේ පටන් මේ දක්වා පැවති මාස තුනක කාලය තුල, මිලිටරි භටයන්, එල්ටීටීඊ සටන්කරුවන් සහ නිලධාරින්, සිවිල් වැසියන් සහ ආන්ඩුවට සම්බන්ධිත පැරා-මිලිටරි කන්ඩායම්වල සාමාජිකයන් ඇතුලු 200කට වැඩි සංඛ්‍යාවක්, රැක සිට කල පහරදීම්වල දී හා ඝාතනවල දී මරා දමා ඇත. බලගතු ජාත්‍යන්තර පීඩනය යටතේ, දෙපාර්ශ්වය ම, දිවයිනේ 20 අවුරුදු සිවිල් යුද්ධය යලි ඇවිලවීමෙන් වලකනු ලැබ, දීර්ඝ කටුක විවාදයකින් පසුව, ජිනීවාහි සාකච්ඡා පැවැත්වීමට එකඟ විය.

සාකච්ඡා හමාර වීමෙන් පසුව, දෙපාර්ශ්වය ම තමන් ජයග්‍රහනයක් අත්පත් කර ගත් බව කියාපෑවේ ය. සිය ප්‍රවෘත්ති සාකච්ඡාවේ දී, ආන්ඩුවේ ප්‍රකාශක රෝහිත බෝගොල්ලාගම ප්‍රකාශ කලේ, "පැහැරගැනීම් හා ඝාතන නතර කිරීමට එල්ටීටීඊය එකඟ කරවා" ගැනීමෙන් තම කන්ඩායම සාර්ථකත්වයක් අත්පත් කර ගත් බව යි. එල්ටීටීඊ ප්‍රධාන සාකච්ඡාකරු ඇන්ටන් බාලසිංහම් අවධාරනය කලේ, සටන් විරාමයට ගරු කිරීමටත් හමුදා-පාලන ප්‍රදේශවල ක්‍රියාත්මක වන පැරා-මිලිටරි කන්ඩායම් නිරායුධ කිරීමටත් ආන්ඩුව එකඟ වී ඇති බැවින් සාකච්ඡා "ජයග්‍රහනයක්" බව යි.

යථාර්ථය නම්, දෙපාර්ශ්වයේ ආරම්භක ප්‍රකාශ තුල පැහැදිලි වූ කොලඹ ආන්ඩුව සහ එල්ටීටීඊය අතර පවත්නා පුලුල් පරතරය, පටු කිරීමෙහි ලා සාකච්ඡා මගින් කිසිවක් සිදු නො වූ බව යි. සාකච්ඡාවලින් පසුව මාධ්‍ය ඉදිරියේ ඒකාබද්ධව පෙනී සිටීම ඔවුන් විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීම මගින් තහවුරු කෙරුනේ දොරගුලු ලාගෙන පැවති සාකච්ඡාවල දී කිසිදු සැලකිය යුතු එකඟතාවකට නොපැමිනි බවයි.

සාකච්ඡාවලට පෙරාතුව, ශ්‍රී ලංකා ආන්ඩුව පැහැදිලි කලේ, තමන්ට සටන් විරාමයේ පරිපූර්න සංශෝධනයක් අවශ්‍ය බව යි. රාජපක්ෂ නොවැම්බර් ජනාධිපතිවරනයෙන් ජයගත්තේ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සහ ජාතික හෙල උරුමය යන සිංහල අන්තවාදී පක්ෂ දෙකෙහි පිටුබලය සහිතව ය. සිය සහයෝගයට ගෙවිය යුතු මිලෙහි කොටසක් ලෙස, ජවිපෙ හා හෙල උරුමය අවධාරනය කර සිටියේ, සටන් විරාම ගිවිසුම ශ්‍රී ලංකා මිලිටරියේ තත්වය ශක්තිමත් කරන ආකාරයේ සැලකිය යුතු වෙනස්කම්වලට භාජනය කිරීම ඇතුලුව, එල්ටීටීඊයට එරෙහිව වඩා තදබල ආස්ථානයක් ගත යුතු බවට යි.

පසුගිය සතියේ කොලඹ පුවත්පත් වාර්තා කල පරිදි, ආන්ඩුව සටන් විරාම ගිවිසුමේ සංශෝධිත කෙටුම්පතක් සකසා ජිනීවා සාකච්ඡා තුල දී එම ලියවිල්ල සභාගත කිරීමේ ප්‍රකෝපකාරී අභිප්‍රායකින් යුක්තව සිටියේ ය. සාකච්චා පැවැත්විය යුත්තේ පවත්නා සටන් විරාමය මුලුමනින් ම ක්‍රියාවට දැමීම පිලිබඳව පමනක් යැයි එල්ටීටීඊය නැවත නැවතත් අවධාරනය කොට තිබුනි.

ආන්ඩුවේ සාකච්ඡා කන්ඩායමේ ප්‍රධානි නිමල් සිරිපාල ද සිල්වාගේ ආරම්භක ප්‍රකාශය වනාහි සටන් විරාමය සංශෝධනය කල යුතු බවට කල සම්මුති විරහිත ප්‍රකාශයකි. ඔහු සිය කතාව ආරම්භ කලේ පවත්නා ගිවිසුම "අපගේ ව්‍යවස්ථාවට හා නීතියට පටහැනි" බව "අවධාරනය කරමිනි". "තව දුරටත්, එය ශ්‍රී ලංකා ජනරජයේ ස්වෛරී භාවයට හා භෞමික අඛන්ඩතාවට හානිකර ය." සටන් නතර කිරීමෙන්" ජනතාවට සමහර වාසි" ලැබුනු බව පිලිගැනීමෙන් පසුව, ඔහු මෙසේ ප්‍රකාශ කලේ යඃ "ගිවිසුමෙන් ඇති කෙරුනු නිශ්චිත දරුනු විෂමතා නිවැරදි කරන ලෙස අපි යෝජනා කර සිටිමු."

ද සිල්වා ඊලඟට යොමු වූයේ සටන් විරාම ගිවිසුම උල්ලංඝනය කල අවස්ථා මාලාවක් සම්බන්ධයෙන් එල්ටීටීඊය හෙලාදැකීමට යි. ඒවායින් බොහොමයක් මුලුමනින් ම සාක්ෂි විරහිත චෝදනා ය. ඔහුගේ කතාවෙන් ගනන් බැලුනේ, මොන යම් හෝ බැරෑරුම් සාකච්ඡාවකට වේදිකාව සැකසීමට වඩා ශ්‍රී ලංකාවේ ආන්ඩුවේ වර්ගවාදී සගයන්ට ආයාචනා කිරීමට යි. කොලඹ දී, රාජපක්ෂ, ජවිපෙ ඉහල නායකයන් වන සෝමවංශ අමරසිංහ සහ විමල් වීරවංශ සමග සමීප අදහස් විමසීමක යෙදී සිටියේ, ජනාධිපති නිල නිවාසයේ "මෙහෙයුම් මධ්‍යස්ථානයේ" සිට චන්ද්‍රිකා හරහා සාකච්ඡාව දිග හැරෙන අයුරු නිරීක්ෂනය කරමිනි.

සිය මිලිටරි හැකියාවන් වැඩි දියුනු කර ගැනීම පිනිස සටන් විරාමය යොදා ගැනීම, සටන් විරාම ගිවිසුම අනේක වාරයක් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු වීම, ලමා සොල්දාදුවන් බඳවා ගැනීම, හිටපු ශ්‍රී ලංකා විදේශ අමාත්‍ය ලක්ෂ්මන් කදිරගාමර් මරා දැමීම ඇතුලු ඝාතන සහ මුස්ලිම් ජනයාගේ අයිතීන් ඇතුලු ප්‍රජාතන්ත්‍ර අයිතීන් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් ද සිල්වා එල්ටීටීඊයට චෝදනා කලේ ය. හමුදාව පැරා-මිලිටරි කන්ඩායම් සමග සහයෝගීව ක්‍රියා කරන බවට එල්ටීටීඊය කල පැමිනිලි සලකා බැලීම පවා ප්‍රතික්ෂේප කල ඔහු අවධාරනය කලේ ජනාධිපති රාජපක්ෂ "අපගේ රටේ සෑම කොටසක ම කිසිදු වෙනස්කමකින් තොරව නීතිය හා සාමය ආරක්ෂා කිරීමට කැප වී" ඇති බවට යි.

ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන් සහ ඒ හා බැඳී ඇති පැරා-මිලිටරි කන්ඩායම් මෙන් ම, එල්ටීටීඊය ද උල්ලංඝනයන් හා ඝාතන සම්බන්ධයෙන් වගකිව යුතු බවට කිසිදු සැකයක් නැත. එහෙත් සාක්ෂිවලින් තොර චෝදනා මැතිරීම මගින් ගනන් බැලුනේ, මොන යම් හෝ අර්ථවත් සාකච්ඡාවකට මාවත සැකසීමට වඩා එල්ටීටීඊය හිතාමතාම සතුරු කර ගැනීම යි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන් පසුගිය මාස තුන තුල ප්‍රජාතන්ත්‍ර අයිතීන් විවෘතව ම උල්ලංඝනය කිරීමෙහි -- ප්‍රදේශ වටලා සෝදිසි මෙහෙයුම් කොට සිය ගනන් දෙමල ජනයා අත්අඩංගුවට ගැනීමෙහි සහ විරෝධතා පෙලපාලිවලට වෙඩි තැබීමෙහි -- නිමග්නව ඇත යන්න ප්‍රසිද්ධ කරුනකි.

සාකච්ඡාව දිග හැරුනු ආකාරය පිලිබඳ තොරතුරු ප්‍රසිද්ධ කොට නැති මුත්, ද සිල්වාගේ කතාව සාකච්ඡා බිඳ වැටීමේ අවස්ථාවට ගෙන ආ බවට සෑම ඇඟවුමක් ම පවතී. සටන් විරාම ගිවිසුම වෙනස් කිරීම ගැන ආන්ඩුව අවධාරනය කල හොත් තමන් සාකච්ඡාවලින් ඉවත් වන බවට එල්ටීටීඊ නියෝජිත කන්ඩායම තර්ජනය කල බව බාලසිංහම් පසුව මාධ්‍යවලට පැවසී ය. "පලමු දිනයේ දී, සටන් විරාමය සමලෝචනය හෝ සංශෝධනය කිරීම සාකච්ඡාවට ගැනීමට ආන්ඩුවට අවශ්‍ය වූ බැවින් න්‍යාය පත්‍රය ගැන එකඟතාවකට පැමිනීමට අපට නොහැකි විය. අපි දැඩි ලෙස එයට එරෙහි වූයෙමු." යැයි ඔහු පැවසී ය.

තමන් සිය විරුද්ධ පාර්ශ්වයට මෙසේ පැවසුවේ යැයි බාලසිංහම් කියා පෑවේ යඃ "ඔබ සටන් විරාම ගිවිසුමේ වලංගු භාවය ගැන ප්‍රශ්න කරන්නේ නම්, අපි ඉවත් වන්නෙමු." මේ අවස්ථාවේ දී, ආන්ඩුවේ නියෝජිත කන්ඩායම අවදානම් තත්වයෙන් අඩියක් පසුපසට ගෙන සිය දැඩි ආස්ථානය අතහැරි බවක් පෙනී යයි. විකල්ප සටන් විරාම ලියවිල්ලක් සභාගත නොකෙරුනු අතර ඉන් අනතුරුව පැවති සාකච්ඡා පවත්නා ගිවිසුම ක්‍රියාවට දැමීම සහතික කර ගැනීම පිලිබඳව කේන්ද්‍රගත විය.

බාලසිංහම්ගේ ආරම්භක කතාව නිශ්චිත කරුනුවලට යොමු විය. එල්ටීටීඊ විරෝධී පැරා-මිලිටරි කන්ඩායම් නිරායුධ කිරීම, සිවිල් වැසියන්ට කෙරෙන හිරිහැර නතර කිරීම, ධීවර කටයුතුවලට පනවා ඇති තහංචි ලිහිල් කිරීම සහ ආගමික ස්ථාන, පාසල් ගොඩනැගිලි හා පොදු ගොඩනැගිලි යනාදියෙන් හමුදා ඉවත් කිරීම ඇතුලු ආන්ඩුව කිසිදාක ක්‍රියාවට දමා නැති වගන්ති මාලාවක් ම ඔහු 2002 සටන් විරාම ගිවිසුමෙන් උපුටා දැක්වී ය.

2003 අප්‍රේල් මස මින් පෙර පැවති සාකච්ඡා බිඳවැටීමෙන් අනතුරුව බාලසිංහම් මෙසේ සටහන් කලේ යඃ "දෙමල පැරා-මිලිටරි කන්ඩායම්වල ප්‍රචන්ඩ ක්‍රියා අපගේ කේඩර්වරුන්ට හා ආධාරකරුවන්ට එරෙහිව එල්ල කෙරුනු ජරා කැරලිකාරි යුද්ධයක රූපාකාරය තුල උත්සන්න වී ඇත. එය වනාහි ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන් දෙමල සන්නද්ධ කන්ඩායම් සමග ක්‍රියාකාරීව සහයෝගී වූ සෙවනැලි යුද්ධයකි." ආන්ඩුවට හිතැති මෙම සන්නද්ධ කන්ඩායම්වල ක්‍රියාකාරකම් ගැනත් විශේෂයෙන් ම ශ්‍රී ලංකා මිලිටරි ඔත්තු සේවාවන් සමග ඔවුන්ට පවත්නා සමීප සබඳතා ගැනත් "සවිස්තර වාර්තාවක්" ඔහු ඉදිරිපත් කලේ ය.

"සන්නද්ධ දෙමල පැරා-මිලිටරි කන්ඩායම්වල පැවැත්ම අවිවාදාත්මක කරුනක්" යැයි ඔහු ප්‍රකාශ කලේ ය.

ශ්‍රී ලංකා හමුදාව පාසල්. රජයේ කාර්යාල සහ ආගමික ස්ථාන යනාදියෙන් ඉවත් වීමට අපොහොසත් වී ඇති බවත් සිය නිවාස, ව්‍යාපාරික ස්ථාන සහ ඉඩකඩම්වලින් පලවා හැරුනු දස දහස් සංඛ්‍යාත ජනයා ආපසු එම ස්ථාන කරා යාම වලකා ගෙන සිටිමින් යාපන අර්ධද්වීපයේ විශාල ප්‍රදේශ අධි ආරක්ෂක කලාප ලෙස දිගටම පවත්වා ගෙන යන බවත් බාලසිංහම් නිරීක්ෂනය කලේ ය. "යාපනයේ නිවාස හිමියන් 28,830ක් ඔවුන්ගේ නිවාසවලින් බලාත්කාරයෙන් පලවා හැර තිබෙන බවත් අක්කර 13,000ක සාරවත් ගොවිබිම් ඔවුනට අහිමි කොට ඇති" බවත් පෙන්වා දෙන "අධි ආරක්ෂක කලාපවල මානුෂ්‍ය වියදම" යැන මැයෙන් යුත් ලියවිල්ලක් ඔහු ඉදිරිපත් කලේ ය. "අධි ආරක්ෂක කලාප නිර්මානය කිරීම පවුල් 20,000ක් දරිද්‍රතාවට ඇද දමා ඇති අතර ඔවුහු දශකයක් තිස්සේ සරනගත කඳවුරුවල හා සුබසාධන මධ්‍යස්ථානවල අපා දුක් විඳිමින් සිටිති."

බාලසිංහම්ගේ සන්සන්දනාත්මක පාලිත ප්‍රවිෂ්ඨය මගින් පිලිබිඹු කෙරෙන්නේ එක්සත් ජනපදය සහ සෙසු මහ බලවතුන් විසින් එල්ටීටීඊය හිර කරනු ලැබ ඇත යන කරුන යි. 2002 දී සාකච්ඡා සඳහා එකග වී වෙනම දෙමල ඊලම් රාජ්‍යයක් පිලිබඳ සිය ඉල්ලීම අතහැර දැමූ එල්ටීටීඊ නායකත්වය බලාපොරොත්තු වූයේ සිංහල හා දෙමල පාලක ප්‍රභූන්ට කම්කරු පන්තිය ඒකාබද්ධව සූරාකෑමේ ඉඩකඩ ලබා දෙන ආකාරයේ බලය බෙදා ගැනීමේ සම්මුතියකට කොලඹ ආන්ඩුව සමග එලඹීම යි. ඒ වෙනුවට, 2003 දී සාකච්ඡා බිඳ වැටී, එල්ටීටීඊය දේශපාලනිකව කිසිවකුට අයිති නැති භූමියක අතරමං කෙරී ඇත. එනම්, සාම සම්මුතියකින් තොරව සහ අනෙක් අතට යුද්ධයෙන් ද තොරව, මිලිටරියේ අඛන්ඩ ප්‍රකෝපකරයන්ට යටත් කෙරී ඇති තත්වයකි.

පරිහානියට පත් වන සමාජ කොන්දේසි සහ ඔවුන් පනවන බදු හේතු කොට ගෙන එල්ටීටීඊය සාමාන්‍ය දෙමල ජනයාගේ වැඩෙන වෛරයට මුහුන දී ඇත. මෙම තත්වයට එය ප්‍රතිචාර දක්වා ඇත්තේ, දෙමල ජනතාවගේ "එක ම නියෝජිතයා" බවට තමන් කරන හිස් කියාපෑම පවත්වා ගෙන යනු පිනිස, මතු වන මොන යම් හෝ විරුද්ධත්වයකට එරෙහිව රුදුරු ලෙස කඩා පැනීම මගිනි. කොලඹ දේශපාලන සංස්ථාපිතය මෙන් ම, එල්ටීටීඊය ද සිය සමාජ පදනම රැක ගනු වස් වාර්ගික ආතතීන් හිතාමතාම අවුස්සා තිබේ. එහි ප්‍රතිඵලය වී ඇත්තේ, රට යලි යුද්ධය කරා ඇද වැටීමේ තර්ජනය මතු කරමින්, එල්ටීටීඊය සහ ආන්ඩුවට සම්බන්ධිත කන්ඩායම් එල්ල කරන ප්‍රහාර හා ප්‍රතිප්‍රහාර චක්‍රය උත්සන්න වීම යි.

ජිනීවා සාකච්ඡාවල ප්‍රතිඵලය ශ්‍රී ලංකාව තුල සහ ජාත්‍යන්තරව ප්‍රශංසාවට ලක්ව ඇති ආකාරය විස්තර කල හැක්කේ සාවද්‍ය ශුභවාදයක් ලෙස පමනි. ස්විස්ටර්ලන්ත රාජ්‍යතාන්ත්‍රිකයෝ සාකච්ඡාවේ ප්‍රතිඵල සාදරයෙන් පිලිගෙන ඊලඟ සාකච්ඡා වටය එලඹෙන තෙක් බලා සිටිති. කොලඹ කොටස් වෙලඳ පොල සාකච්ඡාවේ ප්‍රතිඵලයට ප්‍රතිචාර දක්වමින් සියයට එකකින් ඉහල නැංගේ, ආර්ථිකව විනාශකාරී යුද්ධය අවසානයකට ගෙන ඒමක් පිලිබඳව ව්‍යාපාරික කව තුල පවත්නා බලාපොරොත්තු පිලිබිඹු කරමිනි. ලංකා වෙලඳ මන්ඩලයේ සභාපති දේව රුදිගු, සටන් විරාමය ආරක්ෂා කරමින් තව දුර සාකච්ඡා පැවැත්වීමේ තීන්දු විස්තර කලේ "ඉතා ධනාත්මක" වර්ධනයක් ලෙස ය.

"ප්‍රතිඵලය සතුටුදායකයි" යන මැයෙන් අද ඩේලි මිරර් පත්‍රයේ පල වූ කතුවැකිය මෙසේ ප්‍රකාශ කලේය: "ජිනීවා සාකච්ඡාවල දී අත්පත් කර ගැනුනු සාර්ථකත්වය පිලිබඳ පුවත දැන ගත් කල මෙරට බොහෝ ජනයා සැනසුම් සුසුමක් හෙලන්ට ඇත." පලමු දිනයේ දී සාකච්ඡා බිඳ වැටීමේ අද්දරට යාමේ සිද්ධියට වක්‍ර ලෙස සැඳහුම් කරමින් එය තව දුරටත් මෙසේ කියා සිටී: "කෙසේ වෙතත්, මනෝ චිකිත්සාවේ දී රෝග සුව කිරීමේ ක්‍රියාදාමයක් ලෙස පවා නිර්දේශ කෙරෙන අභ්‍යාසයක් වන, මෙලෙස විවෘතව හා අවංකව දුක්ගැනවිලි ප්‍රකාශ කිරීමෙන් පසුව, සාකච්ඡා කුනාටුවලින් අඩු මාවතක් ඔස්සේ යොමු කිරීමෙහි ලා කතාබහ සමත්ව ඇත යන්න වාසනාවන්ත කරුනකි."

කෙසේ වෙතත්, සාමාන්‍ය ශ්‍රී ලාංකිකයන්ට නම් උත්සවාකාරයේ සැමරීමට කිසිවක් නැත. බලය බෙදා ගැනීමේ සැකැස්මක ප්‍රකාශිත අරමුනු අවසානයේ සාක්ෂාත් කර ගැනුනු විටක පවා, දෙමල, සිංහල හෝ මුස්ලිම් වැඩ කරන ජනතාවගේ ශිෂ්ඨ සම්පන්න ජීවන කොන්දේසි සහ ප්‍රජාතන්ත්‍ර අයිතීන් පිලිබඳ එකදු අභිලාෂයක් වත් ඉටු වන්නේ නැත. ජිනීවා සාකච්ඡා මගින් පැහැදිලි කෙරෙන ලෙස ම, එවන් ගිවිසුමක් දූෂකරතාවන්ගෙන් ගහන වනු ඇත.

පසුගිය අඩ සියවසක කාලය තිස්සේ, ශ්‍රී ලංකාවේ ධනේශ්වරය, කම්කරු පන්තිය භේද කොට සිය පාලනය වාරු කර ගනු පිනිස සිංහල අධිපතිවාදය මත පාදක වී තිබේ. දශක ගනනාවක් තිස්සේ වෙනස්කම් කිරීම් පිලිබඳව දෙමල ජනයාගේ අසහනය හා වෛරය මගින් උපත ලැබූ එල්ටීටීඊය කිසිදු විකල්පයක් ඉදිරිපත් කිරීමට අසමත් ය. දෙපාර්ශ්වය ම වාර්ගික දේශපාලනය තුල ගිලී පවතින්නේ, මොන යම් හෝ බලය බෙදා ගැනීමේ ගිවිසුමකට වඩා යුද්ධයට ඇති ඉඩකඩ විවෘත කරමිනි.

මෙම සතියේ දී, ජිනීවාහි සාකච්ඡා යන අතරතුර පවා, දිවයිනේ තව දුරටත් ඝාතන සිදු විය. සිය සාමාජිකයකුගේ මරනය සිදු කරමින්, මඩකලපු දිස්ත්‍රික්කයේ සිය මුර පොලකට එල්ල කල ප්‍රහාරයකට මිලිටරිය සම්බන්ධ යැයි එල්ටීටීඊය චෝදනා කලේ ය. හමුදාව එම සිද්ධිය ගැන තමන් කිසිවක් නොදන්නා බවට තරයේ ප්‍රකාශ කර සිටි අතර, එම දිස්ත්‍රික්කයේ ම මුස්ලිම් වැසියකු ඝාතනය කිරීම පිලිබඳව පෙරලා එල්ටීටීඊයට චෝදනා කලේ ය.

කොලඹ පල කෙරෙන සන්ඩේ ටයිම්ස් පත්‍රයේ ආරක්ෂක ලියුම්කරු අදහස් දක්වා ඇති පරිදි: "යුද්ධයේ අවතාරය, අඩු ගනනේ අප්‍රේල් 19 දා තෙක්, පහව ගොස් ඇති සෙයක් පෙනී යයි. එහෙත් එකිනෙකා සමග සිනහ වෙමින්, දෙපාර්ශ්වය ම යුද්ධය සඳහා වූ සිය සූදානම දිගට ම ගෙන යනු ඇත."

© www.wsws.org